# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2014 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2014 මාර්තු මස 10 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[299 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 16.00 යි** **තැපැල් ගාස්තුව : රු. 7.50 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 10 වන වගන්තිය, ඒ වගන්තියට (2) වන උපවගන්තියක් එකතු කිරීමෙන් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීම සඳහා පළාත්බද මහාධිකරණයෙහි නඩු පැවරීම වෙනුවට ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ, 10ඊ, සහ 10උ වගන්තිවල දක්වා ඇති ආකාරයට පියවර ගැනීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට හැකි කරවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ, 10ඊ, සහ 10උ වගන්ති ඇතුළත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වන්නේ-

(අ) ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමට වහාම කටයුතු කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයාවරයාට පියවර ගැනීමට හැකි කරවීම සඳහා;

(ආ) පැහැර හරීම සංස්ථාවක් විසින් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් හෝ සිදු කරනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හරිනු ලැබූ බද්ද ඒ සංස්ථාවේ කළමනාකරුගෙන්, ලේකම්ගෙන්, යම් අධ්‍යක්ෂවරයකුගෙන් හෝ ප්‍රධාන නිලධරයාගෙන් නැතහොත් ඒ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකුගෙන් හෝ ධුර දරන්නකුගෙන් අයකර ගැනීම සඳහා;

(ඇ) තහනම් කොට විකිණීමෙන් ගෙවීම් පැහැර හරිනු ලැබූ බද්ද අයකර ගැනීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකි කරවීම සඳහා;

(ඈ) ගෙවීම් පැහැර හරිනු ලැබූ බද්ද, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘතියකින් අයකර ගැනීම සඳහා;

(ඉ) ගෙවීම් පැහැර හරිනු ලැබූ බද්ද, පැහැර හැර ඇති තැනැත්තාට ආපසු ගෙවීමට නියමිත ණය මුදලකින් අඩුකර ගැනීම සඳහා;

(ඊ) ගෙවීම් පැහැර හරිනු ලැබූ බද්ද, මුදලින් ගෙවීම වෙනුවට නිශ්චල දේපළ පැවැරීම මගින් අයකර ගැනීම සඳහා ; සහ

(උ) ගෙවීම් පැහැර හරිනු ලැබූ බද්ද, පැහැර හැර ඇති තැනැත්තාගේ පාරිශ්‍රමිකයෙන් අයකර ගැනීම සඳහා,

විධිවිධාන සැලැස්වීම වේ.

# ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්. ඩී.— ඕ. 12/2014.

**2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2010 අංක 16 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ, 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 10 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්; සහ

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්—

"(2) පැහැර හැර ඇති බද්දක් අයකර ගැනීමට වහාම කටයුතු කිරීම අවශ්‍ය බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී, ඔහු විසින් (1) වන උපවගන්තිය යටතේ නඩුවක් පැවරීම වෙනුවට, මේ පනතේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ, 10ඊ සහ 10උ වගන්තිවල දක්වා ඇති පියවර ගනු ලැබිය හැකි ය.".

10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඈ 10ඉ, 10ඊ, සහ 10උ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ, 10ඊ සහ 10උ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු යː-

"පැහැර හැර ඇති බදු අයකර ගැනීමට වහාම කටයුතු කිරීම අවශ්‍ය වන අවස්ථාවක.

10අ. (1) පැහැර හැර ඇති යම් බද්දක් අයකර ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පියවර ගැනීමට තීරණය කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ පියවර ගැනීමේ දින සිට දින දාහතරක් ඇතුළත පියවර ගනු

2—PL 008082—525 (2014/03)

ලැබ ඇත්තේ යම් බද්දක් සම්බන්ධයෙන් ද ඒ බද්ද පිළිබඳ විස්තර සහ ගන්නා ලද පියවරවල ස්වභාවය සඳහන් කෙරෙන දැන්වීමක් පැහැර හැර ඇති තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) පැහැර හැර ඇති බද්ද අයකරනු ලබන යම් නීතියක් යටතේ කරන ලද තක්සේරුවක් හෝ තක්සේරු සම්බන්ධයෙන් අභියාචන කාර්ය පටිපාටියක් තිබෙන්නා වූ ද, ඒ තක්සේරුවට හෝ තක්සේරුවලට විරුද්ධව අදාළ නීතිය යටතේ නිසි කාලසීමාව ඇතුළත පැහැර හැර ඇති තැනැත්තා විසින් අභියාචනයක් ඉදිරිපත් කොට නොමැති වූ ද අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ දැන්වීම නිකුත් කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත, එසේ අය කරන ලද බද්ද සම්බන්ධයෙන් ඔහු විසින් යම් විරෝධතාවක් ඉදිරිපත් කළ හැකි ය. කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතාව සැලකිල්ලට භාජනය කොට ඒ විරෝධතාව පිළිබඳ ඔහුගේ තීරණය දිය යුතු අතර එය අවසානාත්මක විය යුතු යඃ

එසේ වුව ද, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යුක්තිසහගත හේතුවක් නිසා, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත අභියාචනය කිරීමෙන් පැහැර හැර ඇති තැනැත්තා වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ඔහු විසින් දෙනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ගන්නා ලද පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් අයකර ගන්නා ලද බද්ද, යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් පැහැර හැර ඇති තැනැත්තා විසින් (2) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බවට නිශ්චය කරනු ලබන බද්දේ ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය පැහැර හැර ඇති තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ වූ කිසිම ආපසු ගෙවීමක්, (1) වන උපවගන්තිය යටතේ ගන්නා ලද පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් අයකර ගන්නා ලද බද්ද නොඉක්මවිය යුතු ය.

ප්‍රධාන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් බදු අයකර ගැනීම.

10ආ.(1) ගෙවීම් පැහැර හැර ඇති යම් බදු මුදලක්, එම බදු මුදල අයකරනු ලබන යම් නීතියක් යටතේ නියමිත දිනයේ දී හෝ නියමිත දිනයට පෙර යම් සංස්ථාවක් විසින් ගෙවා නොමැති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම සංස්ථාවේ කළමණාකරු, ලේකම්වරයා, යම් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරින් යම් පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, එකී සංස්ථාව හා සම්බන්ධ යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද එය නොතකා, එම සංස්ථාවේ කළමනාකරුට, ලේකම්වරයාට, අධ්‍යක්ෂවරයාට හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකුට එම බදු ගෙවීම පැහැර හැරියා සේ සලකා ඔවුන්ට එරෙහිව කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ හෝ 10උ වගන්තිය යටතේ ක්‍රියාකිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) ගෙවීම් පැහැර හැර ඇති යම් බදු මුදලක්, එම බදු මුදල අය කරනු ලබන යම් නීතියක් යටතේ නියමිත දිනයේ දී හෝ නියමිත දිනයට පෙර යම් සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් ගෙවා නොමැති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකු හෝ ධූර දරන්නකු, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අයුරින් යම් පටහැනි තත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ හවුල්කරුට හෝ ධූර දරන්නාට එම බදු මුදල් ගෙවීම පැහැර හැරියා සේ සලකා ඔවුන්ට එරෙහිව කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ, 10ඊ හෝ 10උ වගන්තිය යටතේ ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

තහනම් කොට විකිණීමෙන් බද්ද අයකර ගැනීම

10ඈ. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් බදු එකතු කරන්නන් ලෙස යම් තැනැත්තන් පත්කළ හැකි ය.

(2) (අ) මෙම පනතේ 2 වන වගන්තිය යටතේ යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තර ද, පැහැර හැර ඇති තැනැත්තාගේ නම ද, ඒ සහතිකය නිකුත් කළේ කුමන නිලධරයකුටද යන්න ද, ඇතුළත් සහතිකයක් දිසාපතිවරයා වෙත, උප දිසාපතිවරයා වෙත, පිස්කල් වෙත, නියෝජ්‍ය පිස්කල් වෙත හෝ බදු එකතු කරන්නා වෙත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැර හැර ඇති තැනැත්තාගේ චංචල දේපළ තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගේ බද්ද අයකර ගැනීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට බලය ලබා දෙන අතර එසේ අය කරන ලෙස ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) ඉතාමත් යෝග්‍ය යැයි එකී නිලධරයා සලකන ආකාරයකට තහනම් කිරීම සිදු කළ යුතු අතර එම නිලධරයා විසින් යම් චංචල දේපළක් තහනම් කළ විගස එම දේපළවල ලැයිස්තුවක් වහාම පිළියෙල කොට ඔහු විසින් එය අත්සන් කර බද්ද පැහැර හැර ඇති තැනැත්තාට ලබා දිය යුතු අතර එහි පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(ඇ) එසේ තහනම් කරනු ලැබූ දේපළ -

(i) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, තහනමට ගැනීමේ වියදම් සහ ගාස්තු ගෙවීමෙහි ලා ඒ මුදල් පළමුවෙන් අදාළ කළ යුතු අතර, යම් ශේෂයක් වෙතොත් පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා එය අදාළ කළ යුතු ය ;

(ii) විදේශීය ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි හෝ වාණිජ බැංකුවක තැන්පත් කළ යුතු අතර, එයින් ලැබෙන මුදල් තහනමට ගැනීමේ වියදම සහ ගාස්තු ගෙවීමෙහි ලා අදාළ කළ යුතු අතර, යම් ශේෂයක් වෙතොත් පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා එය අදාළ කළ යුතු ය ; සහ

(iii) මුදල් නොවන දේපළක් වන අවස්ථාවක, පැහැර හැර ඇති තැනැත්තා විසින් වියදම් හා ගාස්තු ගෙවීමට යටත්ව, ඒ දේපළ දින පහක කාලයක් තබාගත යුතු ය. පැහැර හැර ඇති තැනැත්තා විසින් නොගෙවා පැහැර හැර ඇති බද්ද එකී දින පහ ඇතුළත වියදම් හා ගාස්තු සමග නොගෙවුවහොත් දිසාපතිවරයා, උප දිසාපතිවරයා, පිස්කල්, නියෝජ්‍ය පිස්කල් හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය. ඒ දේපළ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් හෝ යම් සංස්ථාවක නැතහොත් පොදු සමාගමක කොටසක් වූ අවස්ථාවක තැරව්කරුවකු මගින් එදින පවතින වෙළෙඳ පොළ අගයට ඒ දේපළ විකිණීමට සැලැස්විය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ (iii) වන අනු - ඡේදයේ සඳහන් විකිණීමෙන් ලැබෙන මුදල් -

(i) පළමුව, දේපළ තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ වියදම් හා ගාස්තු ගෙවීම සඳහා යෙදවිය යුතු ය ; සහ

(ii) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා යෙදවිය යුතු ය.

ශේෂයක් වෙතොත් එය තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(ඉ) කිසිම දේපළ තහනමට ගැනීමක් ක්‍රියාත්මක කරනු නොලැබුව ද, එය නොතකා, යම් පැහැර හැර ඇති තැනැත්තකුට විරුද්ධව යම් නිලධරයකු විසින් දරන ලද යුක්තිසහගත වියදම් ඔහු විසින් ඒ පැහැර හැර ඇති තැනැත්තාගෙන් අයකර ගැනීම නිත්‍යනුකූල වන්නේ ය.

(ඊ) මේ උපවගන්තියෙහි "චංචල දේපළ" යන යෙදුමට කර්මාන්තශාලාවක බිමට සවිකරන ලද යම් පිරියතක් හෝ යන්ත්‍රයක් ඇතුළත් වේ.

(3) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තා වූ ද, (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම ප්‍රායෝගිකව කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැර ඇති තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි හෝ යම් දිස්ත්‍රික්කයක් විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද, ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ හෝ නම නැතහොත් නම් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින්, ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ල ම හෝ ඉන් යමක් හෝ පැහැර හැර ඇති බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල් සලකන ඉන් යම් කොටසක් හෝ තහනම් කොට විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක් ඇති වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන කවර හෝ අවස්ථාවක පැහැර හැර ඇති තැනැත්තා වාසික වුව ද, නිර්වාසික වුව ද, ඒ තැනැත්තා වෙත ඒ වේලාවෙහි ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතු ය. එහෙත් පැහැර හැර ඇති තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම, මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බලරහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය.

10ඈ. (1) නොගෙවා පැහැර හැර ඇති බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැර ඇති තැනැත්තාගේ නම ද, අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම් පැහැර හැර ඇති තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන් ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා වෙත කැඳවනු ලැබිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැර ඇති බද්ද දඩයකින් පමණක් දඬුවම් කළ යුතු නැතහොත් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා, ඒ පැහැර හැර ඇති තැනැත්තාට ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරනු ලැබූ දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය.

ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම නොකළ යුතු අතර, ඒ අනුව, ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව සලකා බැලීමට හෝ තීරණය කිරීමට හෝ ගෙවීම පැහැර හැරිය බද්ද අයකර ගනු ලැබ ඇත්තේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට විරුද්ධව අභියාචනයක් විභාග වෙමින් තිබීමේ හේතුව මත පමණක් ඒ නඩු කටයුත්ත දින තිහකට වැඩි කාලයක් කල් දැමීමට හෝ පමා කිරීමට ඒ උපවගන්තියෙහි වූ කිසිවකින් මහෙස්ත්‍රාත්වරයකුට බලය පැවරෙන්නේ යැයි කියවා තේරුම් නොගත යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය තෙක් වූ විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් වූ පැහැර හැර ඇති තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා, ඒ තැනැත්තා බන්ධනාගාරගත කිරීමට නියම කරනු ලැබූ යම් අවස්ථාවක, ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කල් දිය හැකි ය. නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(5) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උපවගන්තිය

යටතේ කල් දීමෙහි හෝ (4) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල් දීමෙහි හෝ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි ය ; තව ද, පැහැර හැර ඇති තැනැත්තාට එලෙස ඇප දීමට නියම කළ විටෙක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) යම් ගෙවීමක් වාරික මගින් ගෙවීමට මහෙස්ත්‍රාත්වරයකු විසින් (4) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබ තිබිය දී, ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු කටයුතු පැවරිය හැකි ය.

(7) (1) වන උපවගන්තිය යටතේ යම් නඩු කටයුත්තක දී බද්ද යථා පරිදි තක්සේරු කරනු ලැබූ බවට හා එය නොගෙවා පැහැර හැරිය බවට කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකය, ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, බද්ද අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනය කොට ඇති බවට කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළිනොගත යුතුය.

(8) මේ වගන්තියේ සඳහන් කර ඇති බදු පැහැර හැරීමක් සංස්ථාවක් විසින් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබ ඇති විට, අවස්ථාවෝචිත පරිදි ඒ සංස්ථාවේ කළමනාකරු, ලේකම්, යම් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකු නැතහොත් ඒ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකු හෝ ධුර දරන්නකු, ඒ වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් දණ්ඩන නියමයකින් නියම කරනු ලබන දඩයකට අමතරව, මහෙස්ත්‍රාත්වරයා

ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් වන්නේ යඃ

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාවේ කළමනාකරුට, ලේකම්ට, යම් අධ්‍යක්ෂවරයකුට හෝ වෙනත් ප්‍රධාන නිලධරයකුට නැතහොත් ඒ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකුට හෝ ධුර දරන්නකුට, ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු නොවන බව හෝ බදු නොගෙවා සිටීම වැළැක්වීමට ස්වකීය බලතල ප්‍රකාරව අවශ්‍ය සියලු පියවර ඔහු විසින් ගෙන ඇති බවට හේතු දැක්වීමට අවසර දෙනු ලැබිය හැකි ය.

ණය ආදියෙන් බද්ද අයකර ගැනීම.

10ඉ. (1) යම් තැනැත්තකු විසින් මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති කවර හෝ නීතියක් යටතේ ගෙවිය යුතු බද්ද නොගෙවා පැහැර හැර ඇත්තා වූ ද, පැහැර හැර ඇති බද්ද 10අ, 10ආ, 10ඇ සහ 10ඈ වගන්ති ප්‍රකාරව අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ ද,—

(අ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට වෙනත් යම් තැනැත්තකු ණයගැතිව සිටීමේ හෝ ඔහු මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව;

(ආ) වෙනත් යම් තැනැත්තකු, පැහැර හැර ඇති තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා, නැතහොත් වෙනුවෙන්, මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව;

(ඇ) පැහැර හැර ඇති තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඈ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට වෙනත් යම් තැනැත්තකු අන් කිසි තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව,

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ද අවස්ථාවක, නොගෙවා පැහැර හැර ඇති බද්දේ ප්‍රමාණයට වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හැර ඇති තැනැත්තා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු) ලියවිල්ලකින් වූ ද දැන්වීමක්, ඒ වෙනත් තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දිය හැකි ය. ඒ දැන්වීම ලැබුණු දිනයෙහි දී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල්වලට ද, දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද, ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(2) පැහැර හැර ඇති තැනැත්තා සහ (මේ වගන්තියේ "හවුල් ගිණුම් ධාරක හෝ ධාරකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් තැනැත්තන් සඳහා හෝ වෙනුවෙන් යම් තැනැත්තකු එක්ව, මුදල් දරන අවස්ථාවක, පැහැර හැර ඇති තැනැත්තා විසින් දායක වූ මුදල්වලට ආරෝපණය කරනු ලැබිය යුතු බවට, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්ව ඇත්තා වූ සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් එලෙස සහතික කරනු ලැබ ඇත්තා වූ හවුල් ගිණුමෙහි ඇති මුදල්වලින් හෝ ඒ මුදල්වල ඒ කොටසින්, දැන්වීමේ නම් කරන ලද නිලධරයාට, පැහැර හැර

ඇති බද්දේ මුදල හෝ එකී කොටස හෝ ගෙවන ලෙස නියම කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබිය හැකි යඃ

එසේ වුව ද-

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම අනුව ක්‍රියා කිරීමෙහි ලා මුදල් ප්‍රේෂණය කරන සෑම තැනැත්තකු ම, ඒ කරුණ පිළිබඳව වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකුට ම දැනුම් දිය යුතු ය;

(ආ) පැහැර හැර ඇති තැනැත්තා හැර වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකු විසින් ම, (අ) ඡේදය යටතේ දැනුම් දීමක් තමා වෙත ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමේ දිනට ඒ හවුල් ගිණුමෙහි ශේෂයේ ඇතුළත් ඔහුගේ ශුද්ධ දායක මුදල නියෝජනය කෙරෙන යම් ප්‍රේෂණයක කොටසක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හිමිකම්පෑමක් කරනු ලැබිය හැකි අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ හිමිකම්පෑම සැලකිල්ලට භාජනය කොට ඒ පිළිබඳ ව තම නියමය කළ යුතු ය;

(ඇ) (ආ) ඡේදය යටතේ කරන ලද කොමසාරිස් ජනරාල්වරයාගේ නියමයකින් අතෘප්තියට පත් සෑම හවුල් ගිණුම් ධාරකයකු ම, ඔහු විසින් කරන ලද දායකවීම්වලට ආරෝපණය කරනු ලැබිය හැකි බවට ඔහු හිමිකම්පෑම් කරනු ලබන යම් මුදලක් හෝ ඒ මුදලේ කොටසක් හෝ අයකර ගැනීම සඳහා ආඥාවක් ඉල්ලමින්, දිසා අධිකරණයෙහි නඩු පවරනු ලැබිය හැකි ය.

(3) (68 වන අධිකාරය වූ) කාලාවරෝධය ආඥාපනතේ යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට නිකුත් කරන ලද දැන්වීමේ දින සිට මාස තුනක් ඉකුත්වීමෙන් පසු, ඒ මුදල හෝ ඒ මුදලේ කොටස අයකර ගැනීම සඳහා කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ ද, සම්බන්ධතාවක් ඇති අන් සියලු තැනැත්තන්ගේ ද, බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තව ද, යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කවර විධිවිධානයක් තිබුණ ද, සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ඒ ගෙවීම සම්බන්ධ වගකීමෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(5) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට, ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත්වීමෙන් දින දාහතරක් ඇතුළත ඒ කරුණු දන්වා, කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වී ඇත්තා වූ ද, (5) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, නැතහොත් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් අඩුකර ගනු ලැබ හෝ අඩුකර ගැනීමට හැකිව තිබී ඒ බද්ද හෝ ඉන් කොටස (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව

ඉකුත් වීමෙන් දින දාහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම්, ඒ තැනැත්තා ද, ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ ප්‍රධාන නිලධරයා ද, අඩුකර ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පුද්ගලිකව වගකිව යුතු ය. ඒ මුදල මේ පනතින් සලස්වනු ලැබූ යම් මාර්ගයකින් අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අයකර ගත හැකි ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හැර ඇති තැනැත්තා" යන යෙදුමට පැහැර හැරිය තැනැත්තකුගේ අනුයෝජිතයකු ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම්, ඔහු විසින් ගෙවිය යුතු විය හැකිව තිබූ බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. තව ද, එබඳු අවස්ථාවක මේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හැර ඇති තැනැත්තා" යන යෙදුමෙන් -

(අ) නැසීගිය තැනැත්තකුගේ පොල්මංකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු;

(ආ) නැසීගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාරගන්නා වූ හෝ එබන්දකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නා වූ, යම් තැනැත්තෙක්; හෝ

(ඇ) නැසීගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ තැනැත්තෙක්

අදහස් වේ.

බද්ද මුදලින් ගෙවීම වෙනුවට ආණ්ඩුවට නිශ්චල දේපළ පැවරීම.

10ඊ. (1) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් නීතියක් යටතේ ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්, ඒ බද්ද මුදලින් ගෙවීම වෙනුවට ඒ තැනැත්තාට අයත් යම් නිශ්චල දේපළක් ඒ තැනැත්තා සහ කොමසාරිස් ජනරාල්වරයා අතර එකඟතාවයෙන් ඒ දේපළ කෙරෙහි නියම කරනු ලබන වටිනාකම අනුව ආණ්ඩුවට පැවරීමට කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ දේපළ ආණ්ඩුව වෙත පැවරීමෙන් පසු එය කළමනාකරණය කිරීමේ ශක්‍යතාව සැලකිල්ලට ගෙන, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ඉල්ලීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවක, ඉල්ලීම් කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද, ඒ දේපළෙහි වටිනාකම වශයෙන්, ඒ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එකඟ වූ මුදල ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු බද්දේ මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූලව ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට කරන ලද පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පැහැර හැර ඇති බදු සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අය කර ගත යුතු බව.

10උ. (1) යම් සේවා නියුක්තයකුගේ සේවායෝජකයකු වෙත හෝ සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමකින්, ඒ සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු වූ ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද යම් බදු මුදලක්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් තුළ දී, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් මාසික වාරික ගණනකින්, ඒ සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අඩු කරන ලෙස ඒ සේවායෝජකයාට හෝ ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය. එක් එක් මාසයේ දී සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් එසේ අඩු කරගනු ලබන මුදල, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවායෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ඔහුගේ සේවායෝජකයා විසින් හෝ ඒ පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා විසින් හෝ යම් බද්දක් අඩු කරනු ලැබූ අවස්ථාවක, ඒ අඩු කිරීම කරනු ලැබූ දිනයෙහි ඒ සේවා නියුක්තයා විසින් ඒ බද්ද හෝ එහි කොටසක් හෝ ගෙවනු ලැබූ ලෙස, මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) ගෙවීම පැහැර හරිනු ලැබූ බද්ද කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරින් ගෙවීමට සේවා නියුක්තයා විසින් කටයුතු සලස්වනු ලැබුවේ නම්, (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ විධානයෙන් පසු කවර හෝ අවස්ථාවක, සේවායෝජකයාට හෝ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට දෙනු ලබන ලිඛිත දැන්වීමකින්, ඒ විධානය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(4) සේවායෝජකයා විසින් හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා විසින් මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් බද්දක් අඩු කළ යුතු අවස්ථාවක දී, ඒ සේවා නියුක්තයා ඔහුගේ සේවා නියුක්තියෙන් අස්වීමට ආසන්න නම් හෝ අස්ව යන්නේ නම්, ඔහු එසේ තම සේවා නියුක්තියෙන් අස්ව යන බව හෝ අස් වූ බව ඒ සේවායෝජකයාට හෝ පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට හෝ දැනගන්නට ලැබුණු පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට දෙනු ලැබූ දැන්වීමෙන් විධාන කරනු ලැබූ පරිදි අඩු කරගත යුතු බද්දේ සම්පූර්ණ මුදල හෝ එහි යම් ඉතිරි කොටසක්, ඒ සේවායෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු සියලුම ගෙවීම්වලින් හෝ යම් ගෙවීමකින් ඔහු විසින් අඩු කර ගනු ලැබිය යුතු ය.

(5) සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් බද්දක් අඩු කිරීම පිණිස (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ සේවායෝජකයා වෙත හෝ ඔහුට පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා වෙත විධානයක් කරනු ලැබුවේ යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් ද, ඒ සේවා නියුක්තයා ඔහුගේ සේවා නියුක්තියෙන් ඉවත්ව ගොස් ඇති නිසා හෝ වෙන යම් හේතුවක් නිසා ඒ සේවායෝජකයාට හෝ එකී තැනැත්තාට ඒ බද්ද සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් අඩුකර ගැනීමට නොහැකි වූ අවස්ථාවක, ඒ සිද්ධියේ කරුණු දක්වමින්, ඒ සේවායෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ම ලිඛිත දැන්වීමක් කළ යුතු ය. එකී සේවායෝජකයා විසින් හෝ එකී තැනැත්තා විසින් අඩු කරගනු නොලැබූ හෝ අඩුකර ගත නොහැකි වූ යම් බද්දක්, සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු බද්දක් බවට එකෙනෙහි ම පත් විය යුතු අතර මේ පනතේ විධිවිධාන සලස්වා ඇති කවර හෝ මාර්ගයකින් අයකර ගනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් අඩුකර ගන්නා ලෙස, සේවායෝජකයාට හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට විධාන කරනු ලැබූ යම් බද්දක් අඩු කර ගැනීමට ද, (5) වන උපවගන්තියෙන් නියමිත පරිදි ඒ අඩු කිරීම කළයුතු දිනයේ සිට දින දාහතරක් ඇතුළත ඒ බවට කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කිරීමට ද, ඒ සේවායෝජකයා හෝ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, නැතහොත් (1) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක් අනුව යම් පාරිශ්‍රමිකයකින් යම් මාසයක දී ඒ සේවායෝජකයා හෝ තැනැත්තා විසින් අඩුකරගෙන හෝ අඩු කර ගත හැකිව තිබුණු නමුත්, ඊළඟ මාසයේ පහළොස්වන දිනට පෙර ඒ බද්දෙහි මුදල කොමසාරිස් ජනරාල්වරයාට නොගෙවනු ලැබූ අවස්ථාවක, ඒ සේවායෝජකයා හෝ තැනැත්තා තනි පුද්ගලයෙක් නම්, ඔහු හෝ ඒ සේවායෝජකයා හෝ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් නැතහොත් පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු ද, මේ වගන්තිය යටතේ අඩු කර ගැනීමට ඒ සේවායෝජකයාට හෝ ඒ තැනැත්තාට විධාන කරනු ලැබූ සම්පූර්ණ බද්ද ගෙවීමට පෞද්ගලික වශයෙන් යටත් විය යුතු ය. ඒ බද්ද ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයකුගෙන් මේ පනතෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති කවර හෝ මාර්ගයකින් අයකරගත හැකි අතර, ඒ බද්ද පැහැර හැර ඇති බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ වූ විධානයකට අනුකූලව, යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් බදු අඩු කරන සෑම සේවායෝජකයකු ම හෝ සෑම වෙනත් තැනැත්තකු ම විසින්, ඒ සේවා නියුක්තයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ අඩු කළ බද්දෙහි

මුදල සඳහන් කරනු ලැබූ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි වූ සහතිකයක් ඔහුට නිකුත් කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුව හොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.